# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2466/46 - 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.12.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කතරගම ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය සභාවේ අංක 7 කතරගම නව නගරය කොට්ඨාසයට තේරී පත්වූ ඇපා කංකානම්ගේ නදීපා අසන්ති ප්‍රියදර්ශනී අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කතරගම ප්‍රාදේශීය සභාවේ අංක 7 කතරගම නව නගරය කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා රත්නප්පුල්ලිගේ සඳුනි නිසංසලා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කතරගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි විතානගේ දොන් ජයාන් ලක්මාල් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් රත්නප්පුල්ලිගේ සඳුනි නිසංසලා, කතරගම ප්‍රාදේශීය සභාවේ අංක 7 කතරගම නව නගරය කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**වී. ඩී. ජේ. ලක්මාල්,**
තේරීම්භාර නිලධාරි,
කතරගම ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මොණරාගල.

EOG 12 - 0095


1A - PG 7404 — 08 (2025/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*